// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1757/17 - 2012 මැයි 10 වැනි බ්‍රහස්පතින්දා - 2012.05.10

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත

### 8 වැනි වගන්තිය යටතේ නියමය

2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 8(1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වරාය හා මහාමාර්ග අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම මෙම උපලේඛනයෙහි නිශ්චිත මාර්ගය, ජාතික මහා මාර්ගයක් විය යුතු යැයි මේ නියමයෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
වරාය හා මහාමාර්ග අමාත්‍ය.

2012 මැයි මස 03 වැනි දින,
බත්තරමුල්ල,
"සෙත්සිරිපාය",
9 වැනි මහලෙහි,
වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| | මාර්ගයේ නම | කොටස (කි. මී.) සිට | දක්වා |
|---|---|---|---|
| | **බස්නාහිර පළාත :** | | |
| 1 | සපුගස්කන්ද තෙල් පිරිපහදු හංදිය - බියගම නිදහස් වෙළඳ කලාපය (සමෘද්ධි මාවත)* පනතේ 10 වැනි වගන්තිය යටතේ අවශ්‍යතා (ඇමුණුම) | 0.00 | 6.77 |

* මෙම මාර්ගය ගැසට් කිරීමෙන් කලින් ප්‍රකාශිත අංක 561/5 හා 1989.06.06 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයේ අඩංගු ජාතික මහාමාර්ග ලෙස දක්වා ඇති උපලේඛනයේ බස්නාහිර පළාත යටතේ "මාබිම - මාකොල මාර්ගය" කි.මී. 0.00 සිට 4.07 දක්වා ලෙස සඳහන් වගන්තිය අහෝසි වන අතර, එකී ජාතික මහාමාර්ගයේ නම "මාබිම - සපුගස්කන්ද මාර්ගය" ලෙස සහ එහි නව දිග කි.මී.0.00 සිට 3.22 දක්වා ලෙස සංශෝධනය විය යුතුය.

1A - G 16010 — 935 (2012/05)

ඇමුණුම

**සපුගස්කන්ද තෙල් පිරිපහදු හංදිය - බියගම නිදහස් වෙළඳ කලාපය (සමෘද්ධි මාවත) ජාතික මහාමාර්ගය සමන්විත ප්‍රදේශය නිශ්චිතව දැක්වෙන සැලැස්ම.**

(i) **පළාත :** බස්නාහිර
(ii) **දිස්ත්‍රික්කය :** ගම්පහ




▬ සපුගස්කන්ද තෙල් පිරිපහදු හංදිය - බියගම නිදහස් වෙළඳ කලාපය (සමෘද්ධි මාවත) ජාතික මහා මාර්ගය

ඇමුණුම

(iii) ජාතික මහාමාර්ගයේ මංසන්ධි :

| අනු. අංකය | මංසන්ධියේ නම | පිහිටීම කිලෝ මීටර් | මංසන්ධියට සම්බන්ධිත මාර්ග හා එහි වර්ගය/අයිතිය | | | |
|---|---|---|---|---|---|---|
| | | | වම | | දකුණ | |
| | | | වර්ගය/අයිතිය | පිවිසුම | වර්ගය/අයිතිය | පිවිසුම |
| 1 | සපුගස්කන්ද තෙල් පිරිපහදු හන්දිය | 0.000 | ජා.මමා.* | කිරිබත්ගොඩ | ජා.මමා. | පට්ටිවිල |
| 2 | | 0.805 | | - | ජා.මමා. | මාබිම |
| 3 | හෙයියන්තුඩුව | 2.705 | ජා.මමා. | ගල්වල්කඩ | - | - |
| 4 | සියඹලාපේ | 5.255 | ජා.මමා. | මුදුන්ගොඩ | ජා.මමා. | කැළණිය |
| 5 | බියගම නිදහස් වෙළඳ කලාපය | 6.770 | ප.ස.මා. | යටිහේන | ප.ස.මා. | දෙකටන |

* ජා.මමා. - ජාතික මහාමාර්ග, ප.ස.මා. - පළාත් සභා මාර්ග,

(iv) මාර්ග අංගෝපාංග :

(අ) බෝක්කු :

| බෝක්කු වර්ගය | ගණන |
|---|---|
| හියුම් පයිප්ප | 06 |
| පෙට්ටි බෝක්කු | 01 |

(ආ) පාලම් :

| අනු. අංක | පාලම් අංකය | පාලමේ නම | ගඟේ/ජල මාර්ගයේ නම | දිග (මීටර) | වර්ගය | මාර්ග පථයේ පළල (මීටර) |
|---|---|---|---|---|---|---|
| 1 | 5/1 | | - | 16.00 | කොන්ක්‍රීට් | 8.70 |
| 2 | 6/1 | | බුළුගහ ඉඩම ඇල | 14.70 | කොන්ක්‍රීට් | 8.70 |

(v) මාර්ග අයිතියේ දිග සහ පළල : පිළිවෙලින් කිලෝමීටර 6.77ක් සහ මීටර 21.0ක් වේ.

(vi) ජාතික මහා මාර්ගය හැඳින්වෙන නිශ්චිත නාමය : සමෘද්ධි මාවත

05-603

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.